පුරප්පාඩු සංඛ්‍යාවෙන් 100% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු රජයේ *ගැසට්* නිවේදනයෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. විභාග යෙන් ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම් කෙරේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.) අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේ දී විෂයන් දෙකෙන් ම උපරිම ලකුණු ලබා ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ රසායනාගාර සහකාර - පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

05.1 අධ්‍යාපන සුදුසුකම් :

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව තව එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම; සහ

(*ආ*) විද්‍යාව විෂය ධාරාව යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සේවයට අදාළ රසායන විද්‍යාව විෂය ඇතුළුව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයන්ගෙන් විෂයන් තුන (03) කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම.

05.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය. ඒ අනුව 2000.12.17 දිනට හෝ ඊට පෙර හා 1988.12.17 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

05.3 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

05.4 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

05.5 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

05.6 සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

*ඉල්ලුම් කළ යුතු පිළිවෙළ* :

06. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව ඒ - 4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම් පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත් 2018.12.17 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා

විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''රසායනාගාර සහකාර - පුහුණු ශ්‍රේණියේ තනතුර - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව'' යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද හෝ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ඉල්ලුම් පත්‍රයේ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය 2/3 වන පිටුවලට ද, ඇතුළත් වන ලෙස සකස් කළ යුතු අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

07. විභාග ප්‍රවේශ පත්‍ර, විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත. විභාග අපේක්ෂකයන් විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කරනු නොලබනු ලබන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඒ සඳහා ඔබ වෙත තබා ගත් ඉල්ලුම් පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි තැපැල් කුවිත්තාන්සියේ පිටපතක් ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍ර එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සහතිව ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුයි.

08. ලිඛිත විභාගයේ දී අනන්‍යතාව සහතික කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියැදුරු බලපත්‍රය හෝ පමණක් පිළිග නු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාග සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේ දී ඉහළම කුසලතාවයක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයේ අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය ආණ්ඩුවේ රස පරීක්ෂක සතුය.

11. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

12. *විභාග ගාස්තු* :

විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 600.00 ක මුදලක් විභාග කොමසාරිස් ජනරාල්ගේ 20-03-02-13 අංක දරන ආදායම් ශීර්ෂයට බැර වන සේ තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයදුම්කරුගේ නමින් ගෙවා ලබා ගත් ලදුපත නොගැලවෙන සේ ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් කරනු නොලැබේ. මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *ලිඛිත විභාගය* :

මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයෙක් විභාගයේ දී පෙනී සිටින සියලු ම ප්‍රශ්න පත්‍රවලට එක ම භාෂාවකින්

පිළිතුරු සැපයිය යුතුය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(01) බුද්ධි පරීක්ෂණය
(02) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

14. *විෂය නිර්දේශය* :

(01) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි.

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වන අතර එම සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

අපේක්ෂකයාගේ තර්කන හැකියාව, සංඛ්‍යාමය හැකියාව, විශ්ලේෂණ හැකියාව හා සාමාන්‍ය බුද්ධිය මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

(02) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය : කාලය පැය 02 කි. මුළු ලකුණු 100 යි.

මෙම ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා මාදිලියේ ප්‍රශ්නවලින් යුක්තවන අතර, සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

අපේක්ෂකයාගේ රසායන විද්‍යා දැනුම පිළිබඳ නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

15. *තේරීම් පරිපාටිය* :

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයකින් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලබා ගත යුතුයි. මෙම විභාගයෙන් සුදුසුකම් ලැබූවන්ගෙන් වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ලිඛිත විභාගයෙන් එක් එක් විෂයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අපේක්ෂකයින් වෙත යැවීමට හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් පියවර ගනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේ දී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ලබා ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් රසායනාගාර සහකාර - පුහුණු ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

16. පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන්ට නියම කෙරෙනු ඇත.

(*අ*) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහ තාක්ෂණික සහතික පත්‍ර;
(*ආ*) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය;
(*ඇ*) මෑතකදී ලබා ගත් චරිත සහතික තුන (03) ක් මින් දෙකක් (02) ක් අන්තිම වරට ඉගෙන ගත් පාසලේ විදුහල්පතිගෙන් සහ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.

17. *වෛද්‍ය පරීක්ෂණය* :
තෝරාගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑ ම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

18. *වැටුප් ක්‍රමය* :
(අංක 3/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනවලට අනුව)
MN-01-2016 - රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540

19. *සේවා කොන්දේසි* :

19.1 මෙම තනතුර ස්ථිරය. වසර 02 ක පුහුණු කාල සීමාවෙන් අනතුරුව පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. දැනටමත් පත්වීම ස්ථිර කරන ලද රජයේ සේවකයකු නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

19.2 තෝරාගනු ලබන අය වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.

19.3 තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රෙගුලාසි හා රජය මඟින් දැනට නිකුත් කර ඇති හා කලින් කළ නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

19.4 අංක 1930/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව රසායනාගාර සහකාර - III ශ්‍රේණියට පත් වී වසර 03 ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුයි.

19.5 ස්ථිර පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හි දක්වෙන පරිදි තම තනතුරට අදළ වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු වේ. අදාළ කාලය තුළ එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබා ගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

19.6 1589/30 *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටි රීතිවල සඳහන් බඳවා ගැනීම සඳහා වූ කොන්දේසි අදාළ වේ.

20. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වන්නේය.

ඒ. වැලිඅංග,
ආණ්ඩුවේ රස පරීක්ෂක.

2018.10.26 වැනි දින,
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 31,
ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල.

උපලේඛනය 01

විභාගය පවත්වන නගර සහ නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| මාතර | 03 |
| කුරුණෑගල | 04 |
| අනුරාධපුර | 05 |
| රත්නපුර | 06 |
| බදුල්ල | 07 |
| යාපනය | 08 |
| මඩකලපුව | 09 |

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

***අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවාගණයේ රසායනාගාර සහකාර III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018***

Open Competitive Examination for Recruitment to the post of Laboratory Assistant Grade - III of the Sri Lanka Technological Service - 2018

01. (අ) විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(ආ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| 1. | |
| 2. | |

(*ගැසට්* නිවේදනයේ උපලේඛන අංක 01 ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සහ නගර අංකය කැමැත්තේ අනු පිළිවෙලින් සඳහන් කරන්න.)

02. (*අ*) මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම : උදා.: (SILVA A. B. C.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි.) :————.

(*ආ*) මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම : (සිංහලෙන්/දෙමළෙන්)
:————. මහතා/මෙනෙවිය/මහත්මිය.

(*ඇ*) මුලකුරුවලින් හැඳින්වෙන නම් : (සිංහලෙන්/දෙමළෙන්) :————.

(*ඈ*) මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි.) :————.

03. ස්ථිර ලිපිනය :

(*අ*) (සිංහලෙන්/දෙමළෙන්) :————.

(*ආ*) ඉංග්‍රීසියෙන් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි.) :————.
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල කරනු ඇත.)

(*ඇ*) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ඉ) දුරකතන අංකය :

ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

04. ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

05. විවාහක අවිවාහක බව : විවාහක - 1 ☐
(කොටුව තුළ අදාළ අංකය යෙදන්න) අවිවාහක - 2

06. ජනවර්ගය : ☐
සිංහල -1
ද්‍රවිඩ -2
වෙනත් -3
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

08. (අ) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනයඃ ☐☐

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*පළමුවන වර*
වර්ෂය :————.
විභාග අංකය :————.

*දෙවන වර*
වර්ෂය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථ්‍යය* | *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(*ආ*) අ. පො. ස. (උ. පෙළ.) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

10. වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් ඃ
    9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.
    9.2 අදළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.
    9.3 අදළ උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත

    12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

13. අයදුම්කරු දනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :————.

14. අයදුම්කරු මීට පෙර රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙකු නම් එසේ ඉවත් වීමට හේතුව :————.

15. විභාග ගාස්තු පිළිබඳව තොරතුරු ඃ
    15.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලයේ නම :————.
    15.2 ලදුපත් අංකය :————.
    15.3 මුදල් ගෙවූ දිනය :————.

මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ අමුණන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

16. *අයදුම්කරුගේ ප්‍රකාශය* ඃ
    මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීම හා විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................ මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය .................. වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

(මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් කළ යුතුය.)

***මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*** :

ඉහත තොරතුරු සඳහන් ......................................... මහතා/මහත්මිය/මෙනෙවිය ..................... කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය ..................... දින සිට ..................... තනතුරක සේවය කරන බවද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද මෙම විභාගයේ ප්‍රතිඵල මත පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවද/නොකරන බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

————,
දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

(මෙය දැනටමත් මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු අයට පමණක් අදාළ වේ.)

11-511

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ජාතික නැටුම්/සංගීත විභාගය - 2018(2019)

උක්ත විභාගය 2019 පෙබරවාරි මස පැවැත්වීම සඳහා මවිසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විතය. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ ප්‍රධාන විෂයය සඳහා වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය ප්‍රධාන විෂයය සහ අනුවිෂයය යන දෙකටම පවත්වනු ලැබේ.

02. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් තුළම, අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටවනු ලැබේ. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවක දී එකී විභාග මධ්‍යස්ථාන අවලංගුකොට අදාළ අයදුම්කරුවන් යාබද විභාග මධ්‍යස්ථාන පිහිටි නගරය වෙත යොමු කිරීමට සිදුවනු ඇත. 5.6 ඡේදයේ සඳහන් නගරවල මෙම විභාගය පැවැත්වේ.

03. විභාගය පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි.

04. මෙම විභාගය පරිගණක ගත විභාගයක් බැවින්, අයදුම්පත් පහත දක්වෙන ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම භාවිත කරමින්, පිළියෙලකර **ඇමුණුම 01 හා ඇමුණුම 02 පදනම් කර ගනිමින්** පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණකර ඉදිරිපත් කළ යුතුය. දී ඇති උපදෙස් පරිදි **ප්‍රධාන විෂයයට අනුකූළ නොවන අනුවිෂයන් තෝරා ගැනීමෙන් වැළකී සිටිය යුතුය.** එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඇමුණුම 01 සහ ඇමුණුම 02 බලන්න.)

05. අයදුම්කරුවන්ට උපදෙස් :

5.1 සුදුසුකම් - සෑම අයදුම්කරුවකුම පහත සඳහන් විභාග අතරින් එකක දී සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතුය.

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය
(ආ) ජ. පො. අ. ස. විභාගය
(ඇ) ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය
(ඈ) මූලික පිරිවෙන් අවසාන විභාගය

ඉහත විභාගවලට සමාන හෝ ඉහළ මට්ටමේ හෝ විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් සාමාර්ථය ලබා ඇත්නම් එය ද වලංගු වේ.

*සැ. යු.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, 5.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ දී සිංහල භාෂාව විෂයය ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය. නැටුම් විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් ශාස්ත්‍රීය අවබෝධය (නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම) ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිටිය යුතුය.

5.2 වයස් සීමාව - 2018.12.20 වන දිනට වයස අවුරුදු 15 සම්පූර්ණ විය යුතු අතර, උපරිම වයස් සීමාවක් නොමැත. අත්සන සහතික කරන බලධාරියා ලවා උප්පැන්න සහතිකය පරීක්ෂා කරවා නිරවද්‍යතාව සහතික කිරීමට වග බලා ගත යුතුය. නියමිත වයස් සීමාව සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

5.3 අයදුම්පත් - ව්‍යවස්ථා සංග්‍රහයට අනුව, ප්‍රාරම්භ පරීක්ෂණයේදී තෝරා ගන්නා ගණය (ප්‍රධාන විෂයය හා ඊට අනුකූල අනුවිෂයය) මධ්‍යම හා අවසාන පරීක්ෂණය සඳහා ද යෙදේ. අයදුම්කරුවන් ප්‍රාරම්භ පරීක්ෂණයේදී තෝරා ගත් ගණය හෝ එම ගණයට අයත් තෝරාගත් විෂයන් හෝ මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා වෙනස් කළ නොහැකිය. එසේ කරනු ලබන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. ප්‍රාරම්භ පරීක්ෂණයේ ප්‍රධාන විෂයයට අනුකූලවන පරිදි අනුවිෂයය ද තෝරා ගැනීම කෙරෙහි අයදුම්කරුවන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.12.20 වන දිනට හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රීලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ ''ජාතික නැටුම්/සංගීත විභාගය - 2018 (2019)'' යනුවෙන් සඳහන් කළ යුතුය.

5.5 අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පෙනී සිටිය යුතු විෂයන් හා අනෙකුත් විස්තර සඳහා අදාළ ව්‍යවස්ථා හා නිර්දේශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ප්‍රධාන විෂයය හා අනුවිෂයය සඳහා විවිධ වූ විෂය අංක භාවිතා වන බැවින් ඉහත 5.3 හි සඳහන් කරුණු පිළිබඳව මනා අවධානයෙන් හා සැලකිල්ලෙන් යුතුව ඇමුණුම 01 හා 02 පරිශීලනය කරමින් ඉතා නිවැරදිව අයදුම්පත සම්පූර්ණ කළ යුතු බව අවධාරණය කරමි. තවද ආදර්ශ අයදුම්පතේ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය 02 වන පිටුවට ද වන ලෙස A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත සකස් කළ යුතුවේ. ආදර්ශ අයදුම්පත දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ද (www.doenets.lk) බාගත (Download) හැක.

5.6 විභාගය පැවැත්වෙන නගර සහ ඊට අදාළ අංක පහත දැක්වේ.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | මහනුවර | 10 |
| ගම්පහ | 02 | කෑගල්ල | 11 |
| කළුතර | 03 | මාතලේ | 12 |
| ගාල්ල | 04 | බදුල්ල | 13 |
| මාතර | 05 | අනුරාධපුරය | 14 |
| තංගල්ල | 06 | පොළොන්නරුව | 15 |
| රත්නපුර | 07 | කුරුණෑගල | 16 |
| අම්පාර | 08 | කුලියාපිටිය | 17 |
| මොනරාගල | 09 | | |

5.7 විභාග ගාස්තු - ලිඛිත විභාගය සඳහා විභාග ගාස්තු පහත සඳහන් පරිදි වේ.

- ප්‍රාරම්භ - රු. 400 0
- මධ්‍යම - රු. 500 0
- අවසාන - රු. 600 0

අදාළ විභාග ගාස්තු ''විභාග කොමසාරිස් ජනරාල්'' නමින් දිවයිනේ ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකි අතර, එසේ අයදුම්කරුගේ නමින්ම මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු නොගෙවන අතර, එම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. නියමිත ගාස්තු ගෙවා නැති අයදුම්පත් හා මුද්දර, මුදල් ඇණවුම් සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුදල් ගෙවා ලබාගන්නා ලදුපතේ හා අයදුම්පතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.8 ප්‍රවේශ පත්‍ර - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ පිටපත හා අයදුම්පත්‍ර තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද ළඟ තබාගෙනම ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ඉල්ලුම්කරන ලද විභාගය සඳහන් කරමින් විමසා සිටිය යුතුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් හා ඉහත සඳහන් ලේඛනවල පිටපත් ෆැක්ස් මගින් ශ්‍රීලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකර, විමසා සිටීම වඩාත් ඵල දයී වේ.

5.9 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ අයදුම්කරුවන් විසින් සපයා ගත යුතුය.

5.10 කිසියම් අයදුම්කරුවකු වෙත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අදාළ අයදුම්කරු විභාගය සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් කිරීමක් නොවේ. අයදුම්කරු සපයා ඇති තොරතුරු සාවද්‍ය බව හෙළිවුවහොත් ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. කිසියම් විභාග අපේක්ෂකයෙකු විභාගය සමත්වීම සඳහා ප්‍රධාන විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ද, ප්‍රායෝගික පරීක්ෂණයේ එක් එක් විෂයයක් සඳහා අවම වශයෙන් 40% ක් බැගින්ද, ලබාගත යුතුය.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්.

සංවිධාන (ආයතනික හා විදේශ විභාග), ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2018 නොවැම්බර් මස 07 වැනි දින.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

***ජාතික නැටුම් විභාගය - 2018(2019) ''D''***

නැටුම්

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P, මධ්‍යම -M, අවසාන -F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින්

ඉංග්‍රීසි සංකේත අක්ෂරය

| ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්) | එහි අංකය |
|---|---|
| | |

1. (*අ*) සම්පූර්ණ නම :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(*ආ*) මුලකුරු අගට යොද මුලකුරු සමග නම :

උද : HERATH MUDALIGE SUPUN PERERA → PERERA H. M. S. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම් කරන විෂයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට් නිවේදනයේ ඇමුණුම 01 බලන්න.*)

| ප්‍රධාන විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

| අනු විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න. (*ගැසට්* නිවේදනයේ 05 වන ඡේදය බලන්න.)

7. (i) ජංගම දුරකථන අංකය :

(ii) ස්ථාවර දුරකථන අංකය :

8. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර :-

| | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

9. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථ්‍යය ලැබූ විභාගය පිළිබඳ විස්තර :

1. වර්ෂය : 2. විභාග අංකය :

3. ඌන සාමාර්ථ්‍යය ලත් *විභාගය :

4. ඌන සාමාර්ථ්‍යය ලත් *අනු විෂයය : විෂයය අංකය :

(මෙහි ඇතුළත් ඇමුණුම 01 ලේඛනයේ සඳහන් විෂය අංකය ම සඳහන් කරන්න. ඌන සාමාර්ථ්‍යය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

*ඌන සාමාර්ථ්‍යයලත් අයදුම්කරුවන් යනු පසුගිය වර්ෂයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයය සමත් වී අනු විෂයය අසමත් වූ අයදුම්කරුවන් පමණක් වේ.

10. (*අ*) උපන් දිනය :

අවුරුද්ද : මාසය : දිනය :

(*ආ*) 2018.12.20 වන දිනට වයස :

අවුරුදු : මාස : දින :

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතුය)

11. ගෙවන ලද විභාග ගාස්තු වචනයෙන් : රු. :————.

(ඉල්ලකමෙන් රු. :————.)

විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :————.

දිනය :————.

(මුද්දර හා මුදල් ඇණවුම් අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත)

12. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් ලදුපත නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

| ලදුපත මෙහි අලවන්න |
|---|

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මෙම එකඟ වෙමි.

―――――,
අයදුම්කරුගේ අත්සන

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු .................. දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් තබන ලද බවද, ඔහුගේ /ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .................. බව ද, උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ /ඇයගේ උපන් දිනය .................. බව ද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15 ට වැඩි බව ද, සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න.)

අත්සන සහතික කරන අයගේ නම :―――――.
තරාතිරම :―――――.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)
ලිපිනය :―――――.

―――――,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :―――――.

*සැළකිය යුතුයි.*—(අයදුම්කරුගේ අත්සන අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරියකු, සාමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු රජයේ හෝ පළාත් පාලන සේවාවක මාණ්ඩලික නිලධාරියෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

ඇමුණුම 01

## ජාතික නැටුම් විභාගය - 2018 (2019) "D"

**නැටුම් - විෂය ලේඛනය හා විෂය අංක**

| විෂය ලේඛනය | විෂය අංකය | | |
|---|---|---|---|
| (අ) ප්‍රධාන විෂයය | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| නැටුම් | | | |
| සබරගමු නැටුම් | 110 | 210 | 310 |
| පහතරට නැටුම් | 120 | 220 | 320 |
| උඩරට නැටුම් | 130 | 230 | 330 |
| බෙර වාදනය | | | |
| පහතරට බෙර වාදනය | 140 | 240 | 340 |
| උඩරට බෙර වාදනය | 150 | 250 | 350 |

| | | | |
|---|---|---|---|
| (ආ) අනු විෂයය | | | |
| සංගීතය | 112 | 212 | 312 |
| බෙර වාදනය | | | |
| සබරගමු දවුල් වාදනය | 113 | 213 | 313 |
| පහතරට බෙර වාදනය | 141 | 241 | 341 |
| උඩරට බෙර වාදනය | 151 | 251 | 351 |
| ජන ගායනා | 114 | 214 | 314 |

| භාරතීය නැටුම් | | | |
|---|---|---|---|
| කථක් | 115 | 215 | 315 |
| කථකලී | 116 | 216 | 316 |
| මනිපූරි | 117 | 217 | 317 |
| භාරත | 118 | 218 | 318 |
| සාම්ප්‍රදායික නැටුම් | | | |
| සබරගමු නැටුම් | 111 | 211 | 311 |
| පහතරට නැටුම් | 121 | 221 | 321 |
| උඩරට නැටුම් | 131 | 231 | 331 |
| නිර්මාණ | 119 | 219 | 319 |
| ශාස්ත්‍රීය අවබෝධය | | | |
| නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම | 122 | 222 | 322 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 | | |

| **ප්‍රධාන විෂයයට අනුකූල නොවන අනුවිෂයය ලේඛනය (මෙම විෂයන් තෝරා ගැනීමෙන් වැළකිය යුතු ය)** | | | |
|---|---|---|---|
| ප්‍රධාන විෂයය හා විෂය අංකය | | අනුවිෂයය හා විෂය අංකය | |
| සබරගමු නැටුම් | 110/210/310 | සබරගමු නැටුම් | 111/211/311 |
| පහතරට නැටුම් | 120/220/320 | පහතරට නැටුම් | 121/221/321 |
| උඩරට නැටුම් | 130/230/330 | උඩරට නැටුම් | 131/231/331 |
| පහතරට බෙර වාදනය | 140/240/340 | පහතරට බෙර වාදනය | 141/241/341 |
| උඩරට බෙර වාදනය | 150/250/350 | උඩරට බෙර වාදනය | 151/251/351 |

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ජාතික සංගීත විභාගය - 2018(2019) ''M''

සංගීත

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P, මධ්‍යම -M, අවසාන -F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින්

ඉංග්‍රීසි සංකේත අක්ෂරය

| ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්) | එහි අංකය |
|---|---|
| | |

1\. (අ) සම්පූර්ණ නම :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොද මුලකුරු සමග නම

උදා : HERATH MUDALIGE SUPUN PERERA → PERERA H. M. S. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම් කරන විෂයයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට්* නිවේදනයේ ඇමුණුම 02 බලන්න.

| ප්‍රධාන විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

| අනු විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(ගැසට් නිවේදනයේ 05 වන ඡේදය බලන්න.)

7. (i) ජංගම දුරකථන අංකය :

(ii) ස්ථාවර දුරකථන අංකය :

8. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර :-

| | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

9. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථ්‍යය ලැබූ විභාගය පිළිබඳ විස්තර :

1. වර්ෂය :-

2. විභාග අංකය :-

3. ඌන සාමාර්ථය ලත් *විභාගය :-

4. ඌන සාමාර්ථය ලත් *අනු විෂයය

විෂයය අංකය :-

(මෙහි ඇතුළත් ඇමුණුම 02 ලේඛනයේ සඳහන් විෂය අංකය ම සඳහන් කරන්න. ඌන සාමාර්ථ්‍යය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

*ඌන සාමාර්ථ්‍යයලත් අයදුම්කරුවන් යනු පසුගිය වර්ෂයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයය සමත් වී අනු විෂයය අසමත් වූ අයදුම්කරුවන් පමණක් වේ.

10. (අ) උපන් දිනය :

අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

(ආ) 2018.12.20 වැනි දිනට වයස :

අවුරුදු : | | | | | මාස : | | | දින : | | |

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

11. දුරකතන අංකය :———————————.

12. ගෙවන ද විභාග ගාස්තු වචනයෙන් රු :————.
(ඉලක්කමෙන් රු:————.)
විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :————.
දිනය :————.
(මුද්දර හා මුදල් ඇණවුම් අලවා එවන අයදුම්පත් දූන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

13. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් ලදුපත නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

| ලදුපත මෙහි අලවන්න |
|---|

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු .................. දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් තබන ලද බව ද , ඔහුගේ /ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .................. බව ද, උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ /ඇයගේ උපන් දිනය .................. බව ද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15 ට වැඩි බව ද, සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න.)

අත්සන සහතික කරන අයගේ නම :——————————.
තරාතිරම :————. (රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)
ලිපිනය :——————————.

—————,
අත්සන සහතික කරන අයගේ අත්සන

දිනය :————.

*සැලකිය යුතුයි.-* (අයදුම්කරුගේ අත්සන අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ හෝ පළාත් පාලන සේවාවක මාණ්ඩලික නිලධාරියෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

ඇමුණුම 02

## ජාතික සංගීත විභාගය - 2018 (2019) "M"

### සංගීත - විෂයය ලේඛනය හා විෂයය අංක

| විෂයය ලේඛනය | විෂයය අංකය | | |
|---|---|---|---|
| (අ) ප්‍රධාන විෂයය | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| ගායනය | 160 | 260 | 360 |
| ස්වර වාදනය | | | |
| වයලීන් | 171 | 271 | 371 |
| එස්රාජ් | 172 | 272 | 372 |
| සරෝද් | 174 | 274 | 374 |
| සිතාර් | 175 | 275 | 375 |
| බටනලා | 176 | 276 | 376 |
| සාරංගි | 177 | 277 | 377 |
| ගිටාර් | 178 | 278 | 378 |
| තාල වාදනය | | | |
| තබ්ලා | 190 | 290 | 390 |

| | | | |
|---|---|---|---|
| (ආ) අනු විෂයය | | | |
| ගායනය | 161 | 261 | 361 |
| ස්වර වාදනය | | | |
| වයලීන් | 181 | 281 | 381 |
| එස්රාජ් | 182 | 282 | 382 |
| සරෝද් | 184 | 284 | 384 |
| සිතාර් | 185 | 285 | 385 |
| බටනලා | 186 | 286 | 386 |
| සාරංගි | 187 | 287 | 387 |
| ගිටාර් | 188 | 288 | 388 |
| තාල වාදනය | | | |
| තබ්ලා | 191 | 291 | 391 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 | | |

* ප්‍රධාන විෂයය හා සමාන වන ලෙස අනුවිෂයය තෝරා ගත නොහැකිය.

උදා. :- (i) ප්‍රධාන විෂයය ''ගායනය'' හා අනු විෂයය ''ගායනය''
(ii) ප්‍රධාන විෂයය වාදනය ''වයලීනය'' හා අනු විෂයය වාදනය ''වයලීනය'' ආදී වශයෙනි.

11-941

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.